# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2489/22 - 2026 මැයි මස 19 වැනි අඟහරුවාදා - 2026.05.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 24/51 (VII)අ

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 202 වන වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 237 වන වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග සහ
නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 මැයි මස 11 වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2026 අංක 03 දරන මෝටර් වාහන (පරීක්ෂා කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2026 ජුනි 30 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) මේ නියෝග ක්‍රියාත්මක වීමෙන් පසුව -

(අ) ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක් විසින් නියාමනය කරනු ලබන මගී ප්‍රවාහන සේවා, පාසල් ළමුන් ප්‍රවාහනය කිරීමේ සේවා, කාර්යාලයීය ප්‍රවාහන සේවා හෝ විශේෂ චාරිකා;

(ආ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නියාමනය කරනු ලබන මගී ප්‍රවාහන සේවා, පාසල් ළමුන් ප්‍රවාහනය කිරීමේ සේවා හෝ විශේෂ චාරිකා; සහ

(ඇ) කුලී පදනම මත කරගෙන යනු ලබන විශේෂ චාරිකා,

සඳහා යොදාගනු ලබන සෑම මෝටර් කෝච් රථයක්, සැහැල්ලු මෝටර් කෝච් රථයක් හෝ ද්විත්ව කාර්ය වාහන පංතියේ ලියාපදිංචි කරන ලද වෑන් රථයක් සඳහා ම, මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරනු ලබන සහතික කිරීමේ නිලධරයකු විසින් අදාළ වාහනය මාර්ගයේ ධාවනයට සුදුසු බවට භෞතික ලෙස පරීක්ෂා කොට සනාථ කරමින් නිකුත් කරන ලද මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වන ලද ආකෘතියෙන් සහතිකයක් ලබාගත යුතු ය.


1A - PG 7713 — 378 (2026/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) මේ නියෝග යටතේ නිකුත් කරන ලද සහතිකයක් -

(අ) ඒ සහතිකය නිකුත් කරන අවස්ථාවේ දී සටහන්ව ඇති ධාවන මනු දර්ශකය කියවුම් අගයේ සිට කිලෝමීටර පන්දහසක දුරක් වාහනය ධාවනය කර ඇති දිනය; හෝ

(ආ) එසේ නිකුත් කරනු ලබන දින සිට මාස තුනක කාලසීමාවක් ඉකුත් වන දිනය,

යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා වලංගු විය යුතු ය.

(3) (2) වන උපනියෝගය යටතේ වන සහතිකයේ වලංගුභාවය අවසන් වූ පසු, වාහනය නැවත පරීක්ෂා කරනු ලැබිය යුතු අතර ඒ වාහනය සම්බන්ධයෙන් අලුත් සහතිකයක් ලබාගත යුතු ය.

3. (1) මෝටර් රථ පරීක්ෂා කිරීම හා සහතික කිරීම සිදු කිරීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු -

(අ) මෝටර් වාහන කාර්මික ශිල්පය පිළිබඳ N.V.Q. IV වන මට්ටමේ සුදුසුකමක් හෝ ඊට සමාන සුදුසුකමක් ලබාගෙන තිබිය යුතු ය; සහ

(ආ) ඒ පරීක්ෂා කිරීම් පැවැත්වීම සඳහා බලය ලත් ආයතනයක් හෝ ගරාජයක් හරහා අයදුම් කිරීමෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ලබා ගත යුතු ය.

(2) යම් තැනැත්තකු (1) වන අනුනියෝගයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සපුරා ඇති බවට මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයා විසින් සෑහීමකට පත් වීමෙන් පසුව, එම තැනැත්තා පත්වීමේ ලිපියෙහි නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසිවලට යටත්ව පත් කරනු ලැබිය යුතු ය.

4. 2 වන නියෝගයේ සඳහන් කරන ලද මෝටර් කෝච් රථයක්, සැහැල්ලු මෝටර් කෝච් රථයක් හෝ ද්විත්ව කාර්යය වාහන පන්තිය යටතේ ලියාපදිංචි කරන ලද වෑන් රථයක් පරීක්ෂා කිරීම සිදු කිරීමේ කාර්ය සඳහා -

(අ) මගී බස් සේවා ආරම්භ වන ස්ථානවල;

(ආ) ගමනාන්තවල;

(ඇ) සියලු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානවල;

(ඈ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් සියලු ඩිපෝවල; සහ

(ඉ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ ගරාජවල,

එම කර්තව්‍ය කරගෙන යෑම සඳහා අවශ්‍ය පහසුකම් සලසා තිබිය යුතු ය.

5. 2 වන නියෝගයේ සඳහන් කරන ලද වාහනයක් පරීක්ෂා කිරීම, II වන උපලේඛනයේ දක්වා ඇති පිරික්සුම් ලැයිස්තුව භාවිතා කර සිදුකරනු ලැබිය යුතු ය.

6. (1) 2 වන නියෝගයේ සඳහන් කරන ලද සහතිකය පිටපත් දෙකකින් සමන්විත විය යුතු අතර -

(අ) එක් පිටපතක්, 2 වන නියෝගයේ සඳහන් කරන ලද වාහනයේ රියදුරා සතුව තබාගත යුතු ය; සහ

(ආ) දෙවන පිටපත, සහතික කිරීමේ නිලධරයා සතුව තබාගත යුතු ය.

(2) 2 වන නියෝගයේ සඳහන් කරන ලද වාහනයක සෑම රියැදුරකු විසින් ම, රථ වාහනය ධාවනය කරන අතරතුර සෑම වේලාවකදී ම, 2 වන නියෝගයේ සඳහන් කරන ලද සහතිකය තමා සන්තකයේ තබා ගත යුතු අතර, බලයලත් නිලධරයකු විසින් ඉල්ලූ විට පරීක්ෂා කිරීම සඳහා එම සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

7. මේ නියෝගවල කාර්යය සඳහා -

"ජාතික ගමනාගමන කොමිෂන් සභාව" යන්නෙන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ජාතික ගමනා ගමන කොමිෂන් සභාව අදහස් වේ;

"පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය" යන්නෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් අදාළ පළාත් ප්‍රඥප්තිය යටතේ පළාතක් සඳහා පිහිටුවා ඇති අධිකාරියක් අදහස් වන අතර, ඊට ඒ පළාත තුළ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාවලට අදාළව ඒ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට නෛතිකව බලය ලද යම් අනුප්‍රාප්තික මණ්ඩලයක් හෝ යම් නිලධරයකු හෝ නියෝජ්‍යායතනයක් ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය" යන්නෙන් 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අදහස් වේ.

**I වන උපලේඛනය**

**(2 වන නියෝගය)**

**මෝටර් වාහන (පරීක්ෂා කිරීමේ) නියෝග යටතේ නිකුත් කරනු ලබන**

**මෝටර් වාහන පරීක්ෂා කිරීමේ සහතිකය**

**වාහනයේ විස්තර**

1. ලියාපදිංචි අංකය : ............................................................................................................................................

2. චැසි අංකය : ...................................................................................................................................................

3. එන්ජින් අංකය : ..............................................................................................................................................

4. වර්ගය/මාදිලිය : ..............................................................................................................................................

5. නිෂ්පාදිත වර්ෂය : ...........................................................................................................................................

6. වාහන පන්තිය/වර්ගය : ....................................................................................................................................

7. ආසන/ පැටවුම් ධාරිතාවය : ..............................................................................................................................

8. ධාවන මනු දර්ශකය : .......................................................................................................................................

9. අයිතිකරුගේ නම සහ ලිපිනය : .........................................................................................................................

**වාහනයේ පරීක්ෂණ ප්‍රතිඵල විස්තර**

☐ - වාහනය සඳහා ධාවන පරීක්ෂාව සිදුකර සහතිකය නිකුත් කර ඇත.
- ධාවනය අනුමත කරන ලදී.

☐ - වාහනය සඳහා ධාවන පරීක්ෂාව සිදුකර සහතිකය අත්හිටුවා ඇත.
- ධාවනය අනුමත නොකරන ලදී.

**අඩුපාඩු සටහන් (ඇත්නම්) :**

.............................................................................................................................................................................

.............................................................................................................................................................................

.............................................................................................................................................................................

.............................................................................................................................................................................

.............................................

**සහතික කිරීම**

සහතික කිරීමේ නිලධරයාගේ අත්සන : ....................................................................

නිල මුද්‍රාව : ............................................................................................................

නිකුත් කළ දිනය සහ වේලාව : ..................................................................................

**II වන උපලේඛනය**

**(5 වන නියෝගය)**

**මගී ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කිරීමට පෙරාතුව සිදු කළ යුතු අවම**

**පිරික්සුම් ලැයිස්තුව**

(මෙම පිරික්සුම් ලැයිස්තුව මගින්, මගී ප්‍රවාහන වාහන භාවිත කිරීමට පෙරාතුව, ඒවා නෛතික වශයෙන් අනුකූල වන බව, ආරක්ෂාකාරී බව සහ ක්‍රියාත්මක කිරීමට සුදුසු බව තහවුරු කිරීම, අපේක්ෂා කරනු ලැබේ.)

**1 වන කාණ්ඩය - ලේඛන සත්‍යාපනය කිරීම**

| පරීක්ෂාව | පරීක්ෂා කරන අයිතමය | නිර්දේශිත ප්‍රමිතිය | තත්ත්වය (✓/ X ) |
|---|---|---|---|
| ලේඛන | රියදුරු බලපත්‍රය, මගී ප්‍රවාහන බලපත්‍රය | ඉකුත් නොවූ සහ වලංගුව පැවතීම | |
| | වාහන බලපත්‍රය, ආදායම් බලපත්‍රය, රක්ෂණය, මාර්ග ධාවන යෝග්‍යතා සහතිකය | ඉකුත් නොවූ සහ වලංගුව පැවතීම | |
| | පෙර දෝෂ පිළිබඳ වාර්තාව | සියලුම බරපතල දෝෂ නිවැරදි කර තිබීම | |

**2 වන කාණ්ඩය - දෘශ්‍ය පරීක්ෂණය (වාහනය නවත්වා ඇති එන්ජිම පනගන්වා නොමැති)**

ශ්‍රේණිගත කිරීමේ පරිමාණය, 2 වන සහ 3 වන කාණ්ඩවල සියලුම අයිතම සඳහා අදාළ වේ.

| ලකුණු | | විස්තරය |
|---|---|---|
| 1. | ඉතා දුර්වලයි | - අනාරක්ෂිතය, වහාම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. |
| 2. | දුර්වලයි | - ප්‍රධාන දෝෂ නිරීක්ෂණය වේ. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. |
| 3. | සතුටුදායකයි | - සුළු ගැටළු ඇත, වාහනය භාවිත කළ හැකි ය. |
| 4. | හොඳයි | - සම්පූර්ණයෙන් ක්‍රියාකාරිය, දෝෂ නොමැති ය, වාහනය භාවිත කළ හැකි ය. |
| 5. | ඉතා හොඳයි | - විශිෂ්ට තත්ත්වයෙන් ඇත. වාහනය භාවිත කළ හැකි ය. |

| පරීක්ෂාව | පරීක්ෂා කරන අයිතමය | නිර්දේශිත ප්‍රමිතිය | තත්ත්වය (ශ්‍රේණිගත කිරීම) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | 5 |
| බාහිර තත්ත්වය | ආරක්ෂාවට හෝ ක්‍රියාත්මක කිරීමට බලපාන ලෙස වාහනයේ බඳ පෙදෙසට හානි | පිරිසිදු වීම, ආරක්ෂිත වීම, හානිවලින් තොරවීම | | | | | |
| | ලිහිල් උපාංග (පාපුවරුව, ආරක්ෂක වැට ආදිය) | අරක්ෂිත ලෙස සවිකර තිබීම, ලිහිල් නොවීම | | | | | |
| | ද්‍රව කාන්දුවීම් (එන්ජිම, ගියර්, ඩිෆ්රන්ෂල් තෙල්, හබ් ග්‍රීස්/තෙල්, හයිඩ්‍රොලික්/වායු අත්හිටුවීම, කම්පන) | කාන්දුවීම් නොතිබීම | | | | | |
| | පැති කණ්ණාඩි | ඉරිතැලීම් නොතිබීම, නිසි ලෙස සීරු මාරු වීම | | | | | |
| ටයර් සහ රෝද | ජනේල, වාමුවාව, වාමුවා පිසිනය | පැහැදිලි දෘශ්‍යතාව, ඉරිතැලීම් නොතිබීම, වයිපර් තල සේවා කළ හැකිය. | | | | | |
| | අලෙවියෙන් පසුව බාහිරින් කරන ලද වෙනස්කම් | අනුමත අවසරය සමග අනුකූල වීම | | | | | |
| | ටයර් පීඩනය | නිෂ්පාදිතයා විසින් නිශ්චිතව දක්වා ඇති පීඩනය පරිදි තිබීම. | | | | | |
| | ටයරයේ කට්ටා රටාවේ ගැඹුර | ප්‍රමිතිගත ගෙවීම් මට්ටමට (ටී.ඩබ්ලිව්.අයි) ගෙවී නොතිබීම, තැනින් තැන ගෙවීම් නොතිබීම | | | | | |
| | ටයර්වල දෙපස බිත්ති | කැපුම්, ඉදිමුම්, නිරාවරණය වූ නූල් නොතිබීම | | | | | |
| | රෝදවල මුරිච්චි | සියලුම මුරිච්චි තිබීම, ඒවා තදින් සවිකර තිබීම, මලකඩ නොතිබීම | | | | | |
| | අමතර රෝදය, රෝද ගලවනය/ජැක්කුව | භාවිතයට සුදුසු තත්ත්වයෙන් පැවතීම | | | | | |
| අභ්‍යන්තර තත්ත්වය | මගී ආසන | පිරිසිදු වීම ආරක්ෂිත වීම, තියුණු මායිම් නොමැති වීම | | | | | |
| | රියදුරු ආසන | පහසුවෙන් සීරුමාරු කළ හැකි වීම සහ ආරක්ෂිත ලෙස සවි කර තිබීම | | | | | |
| | එච්. වී. ඒ. සී/සංවාතනය (අදාළ වේ නම්) **HVAC** | නිෂ්පාදකයාගේ පිරිවිතර පරිදි ක්‍රියා කිරීම/මගින් නොමැති විට ආසන මට්ටමේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 20ට අඩු වීම | | | | | |

| පරීක්ෂාව | පරීක්ෂා කරන අයිතමය | නිර්දේශිත ප්‍රමිතිය | තත්ත්වය (ශ්‍රේණිගත කිරීම) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | 5 |
| සුරක්ෂිතතාව | අත් වැටවල්, ආධාරක, බිම් තහඩු | පිරිසිදු වීම, ආරක්ෂිත වීම, පය පැකිලී වැටීමේ අවධානමෙන් තොර වීම | | | | | |
| | ගිනි නිවනය | පුරවා තිබීම, දර්ශකය කොළ කලාපයේ පිහිටීම, කල් ඉකුත්වී නොතිබීම, ප්‍රවේශ වීමට හැකි වීම. | | | | | |
| | අලෙවියෙන් පසු අභ්‍යන්තරයෙන් සිදු කරන ලද වෙනස්කම් | අනුමත අවසරය සමග අනුකූල වීම | | | | | |
| | හදිසි පිටවීම්/හදිසි අවස්ථාවක දී භාජනය කරන මිටි (සවිකර ඇත්නම්) | තිබීම සහ ඒවා සවිකර ක්‍රියාත්මක කළ හැකි වීම | | | | | |
| | ආරක්ෂක බඳ පටි | පලුදු වීම් නොමැති වීම, බකල් ගාංචු තිබීම | | | | | |
| | රෝද පුටු ඔසවනය/ බෑවුම් මග (සවිකර ඇත්නම්) | සුමට ක්‍රියාකාරිත්වයක් පැවතීම, ගැස්සීම් නොමැති වීම | | | | | |
| | ආසන අතර ගමන් මග සහ පිටවීමේ මාර්ග | පැහැදිලි වීම සහ බාධා නොමැති වීම | | | | | |
| | අභ්‍යන්තර අනතුරු | තියුණු මායිම් සහ ලිහිල් වූ උපකරණවලින් තොරව ඇතුළත තිබීම | | | | | |

**3 වන කාණ්ඩය - පරීක්ෂණ ධාවනය (එන්ජිම පණගැන්වීම සහ කෙටි ධාවනය අතරතුර)**

| පරීක්ෂාව | පරීක්ෂා කරන අයිතමය | නිර්දේශිත ප්‍රමිතිය | තත්ත්වය (ශ්‍රේණිගත කිරීම) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | 5 |
| රියදුරුගේ මෙහෙයුම් උපාංග | මෙහෙයුම් පුවරුව මත සවිකර ඇති අනතුරු ඇඟවීමේ දර්ශකය | අනතුරු ඇඟවීමේ දර්ශක සක්‍රියව නොතිබීම | | | | | |
| **සුක්කානම සහ දුනු** | සුක්කානමේ නිදහස් බුරුල | නිෂ්පාදිතයාගේ පිරිවිතර සීමාව තුළ පැවතීම | | | | | |
| | වාහනය නවතා ඇති විට බල සුක්කානමේ ක්‍රියාකාරීත්වය | සුමටව ක්‍රියා කිරීම / අසාමාන්‍ය ශබ්දයක් නොමැතිවීම | | | | | |
| | අඩු වේගයේ දී සුක්කානමේ ක්‍රියාකාරිත්වය | සුමටව ක්‍රියාකිරීම සහ ප්‍රතිචාර දැක්වීම | | | | | |
| | දුනුකොළ, වායු බැලුන, කම්පන **අවශෝෂක** | ස්ථායීව තිබීම, බුරුල් නොවීම, අධික ගැස්සීම්වලින් තොරවීම | | | | | |
| තිරිංග | සේවා (පැඩලය) තිරිංග | නිසි නිදහස් බුරුලක් සහිතව පැඩලය තිබීම | | | | | |

| පරීක්ෂාව | පරීක්ෂා කරන අයිතමය | නිර්දේශිත ප්‍රමිතිය | තත්ත්වය (ශ්‍රේණිගත කිරීම) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | *1* | *2* | *3* | *4* | *5* |
| | නවතා තැබීමේ තිරිංග | බෑවුම මත නවතා තැබීමට හැකි වීම | | | | | |
| | හදිසි බිඳවැටීමක දී සුරක්ෂිත, පිටාර වායු තිරිංග (සවිකර ඇත්නම්) | නිවැරදිව ක්‍රියාත්මක වීම | | | | | |
| | වායු තිරිංග පද්ධතිය (අදාළ වේ නම්) | ආරක්ෂිත පරාසය තුළ පීඩනය පැවතීම, නිසි කාලය තුළ ක්‍රියා කිරීම | | | | | |
| සම්ප්‍රේෂණය | ක්ලචය, ගියර් මාරුව | අසාමාන්‍ය ශබ්දයක් නොමැතිව සුමටව ක්‍රියා කිරීම | | | | | |
| එන්ජිමේ ක්‍රියාකාරීත්වය | පිටවන දුම හෝ ශබ්දය | ක්ෂණික ත්වරණයේ දී අධික දුම හෝ අසාමාන්‍ය ශබ්දයක් නොමැතිවීම | | | | | |
| විද්‍යුත් පද්ධති | බැටරි සහ පණගැන්වීමේ මෝටරය | ක්‍රෑන්ක් කර පණගැන්විය හැකි වීම | | | | | |
| | ප්‍රධාන විදුලි ලාම්පු (පහත්, උස් කදම්භ) | දැල්වීම | | | | | |
| | තිරිංග පහන්, පසුපස පහන්, හරවන දිශාව හඟවන පහන්, අනතුරු ඇඟවීමේ පහන්, පසුපසට ධාවනය අඟවන පහන්, අවධානම් ඇඟවීමේ නලා | දැල්වීම | | | | | |
| | නලාව, පසුපසට ධාවනය හඟවන නලාව | ක්‍රියා කිරීම සහ ඒකීය නාදයක් | | | | | |
| | ඇතුළත කැබින් එකේ සහ පඩිවල පහන්වල ක්‍රියාකාරීත්වය | දැල්වීම | | | | | |

EOG 05 - 0200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.